Embassy of the United States of America

Colombo

# PRESS RELEASE

Public Affairs Section

Tel: +94 (1) 249-8100 ● Fax: +94 (1) 244-9070

Email: shenjy@state.gov ● http:/lk.usembassy.gov

Release No. 20170126S

## දිළිඳුකම පිටුදැකීමට මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් ආයතනය හවුල් විසඳුම් සොයයි.

ජනවාරි 26, 2017: මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් ආයතනයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ශ්‍රී ලංකාවේ තුන් -දින සංචාරයක් මේ සතියේ නිම කල අතර ආර්ථික වර්ධනය හරහා දිළිඳුකම පිටුදැකීමේ සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලදී. මෙම දූත පිරිස ශ්‍රී ලංකා රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, සිවිල් සමාජ ක්‍රියාධරයින් සහ පෞද්ගලික අංශයේ ඉහළ නිලධාරීන් කොළඹ දී හමුවූ අතර කිලිනොච්චියේ පවත්වාගෙන යන සාර්ථක ව්‍යාපාර කිහිපයක්ද සංචාරය කළෝය.

ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපති අතුල් කෙෂප් පවසා සිටින්නේ මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් ආයතනයේ සංගත වීම සඳහා ශ්‍රී ලංකාව තේරී පත්වීම,  මෙරට තුල යුක්තිය සහ ප්‍රජාතන්ත්‍රවාදය, ආර්ථික නිදහස සහ තම ජනතාව තුල ආයෝජනය කිරීමෙහි සිදු වී ඇති ප්‍රගතිය පිළිබඳව මනාව සනාථ වන බවයි.

මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් ආයතනයේ ව්‍යාපෘති මුලිකවම, රටක සෞභාග්‍ය ඉහළ නැංවීම සඳහා දේශීයව උපයෝගී කරගන්නා විසඳුම් දෙස අවධානය යොමු කරයි. මේ සඳහා රටවල් තෝරා ගනු ලබන්නේ ඉතා දැඩි ලෙස දූෂණය පිටුදැකීමේ සිට ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට ගරු කරන, යහපාලන ප්‍රතිපත්ති ඉතා ඉහළින් අනුගමනය කරන රටවල්ය.

ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන ප්‍රමුඛතා හඳුනා ගැනීමට මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් ආයතනයේ නිලධාරීන් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ, මුදල් අමාත්‍ය රවී කරුණානායක, නියෝජ්‍ය විදේශ කටයුතු අමාත්‍ය හර්ෂ ද සිල්වා සහ නියෝජ්‍ය රාජ්‍ය ව්‍යවසාය අමාත්‍ය එරාන් වික්‍රමරත්න හමුවිය. පෞද්ගලික  ආයෝජන තුළින් ශ්‍රී ලංකාවේ ඌන සංවර්ධිත ප්‍රදේශයන්හි රැකියා ජනනය, වෘත්තීය පුහුණුව සහ අධ්‍යාපනික අවස්ථා උදා කර දීම පිළිබඳව ඉගෙනීමට මෙම දූත පිරිස කිලිනොච්චි හි පිහිටි කාගිල්ස් සහ MAS හෝල්ඩින්ග්ස් කර්මාන්තශාලා ද සංචාරය කළෝය.

මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් ආයතනයේ සංගත මෙහෙයුම් පිළිබඳ කලාපීය නියෝජ්‍ය උප සභාපතිනි ෆාතෙමා සුමාර්, ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත දියුණු කිරීමට සහ රටේ ඉදිරි වර්ධනය උදෙසා මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් ආයතනය සමඟ හවුල් වීම ශ්‍රී ලංකාවට වැදගත් අවස්ථාවක් වන්නේ යැයි පවසයි.

"ශ්‍රී ලංකාවට සහ මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් ආයතනයට මෙය ඉතා වැදගත් කාලයක් වන්නේය. ශ්‍රී ලංකාවේ අනාගත වර්ධනයට උර දී ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත දියුණු කිරීමට අපි ක්‍රියා කරන්නෙමු" යැයි මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් ආයතනයේ සංගත මෙහෙයුම් සඳහා වූ කලාපීය නියෝජ්‍ය උප සභාපතිනී ෆාතෙමා සුමාර් පැවසුවාය.

###